*සැ. යු.* - 2012.07.13 දින පළ වූ අංක 1,768 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2011 වර්ෂයට අදාල උප්පැන්න, විවාහ හා මරණ රෙජිස්ට්‍රාර්වරුන්ගේ නාමලේඛනයක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1768 - 2012 ජූලි 20 වැනි සිකුරාදා - 2012.07.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | –– |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1194 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | –– |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අගෝස්තු මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජූලි මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් පාලන නිවේදන

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් සභාව විසින් බලය පවරන ලදුව කුච්චවේලි ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව මෙයින් පළ කරනු ලැබේ.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව,

යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි , 126 වැනි හා 121 (අ) වැනි වගන්ති යටතේ බලය පවරන ලද විධිවිධානවලට අනුව 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන අති *විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් යෝජනා කරන ලද නැගෙනහිර පළාත් සභාවට අදාළ වන්නක් බවට සම්මත කරන ලද්දාවූ 2012 මැයි 30 වැනි දින අංක 3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටසේ පළ කරන ලද්දාවූ අතුරු ව්‍යවස්ථාවල I වැනි කොටස II වැනි කොටසේ අංක 01 සිට 42 දක්වා වූ කොටස් මෙම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මෙම *ගැසට් පත්‍රයේ* පළවන දින සිට කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට ඒකමතිකව තීරණය කරන ලදී.

07-576

---

## හොරණ නගර සභාව

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 46 හා 50 වගන්ති ප්‍රකාර කරනු ලබන දැන්වීමයි

01. නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 46,50 සහ 52 වැනි වගන්ති ප්‍රකාරව බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරණ නගර සභා සීමාවේ පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් හොරණ නගර සභාව සතු මංමාවත් ලෙස හොරණ දිසා අධිකරණයේ අංක 6169/එල් නඩුවේ තීන්දුව අනුව ප්‍රකාශයට පත් කිරීමට නගර සභාවේ මහ සභාව තීරණය කර ඇත.

02. හොරණ දිසා අධිකරණයේ අංක 6169/එල් නඩුවේ 2011.08.01 දින ලබාදුන් තීන්දුව හා තීන්දු ප්‍රකාශය අනුව බලයලත් මිනින්දෝරු ජී. අදිකාරම් මහතා විසින් මැන සකස් කරන ලද මෙම නඩු වාර්තාවට ගොනුකර ඇති 2009.12.12 අංක 3507 දරන පිඹුරේ කොළපාටින් සළකුණු කර ඇති කහටගහවත්ත පාර පොදු පාරක් වශයෙන් පැවතිය යුතු බවට තීන්දු කර ඇති නිසා මෙම පහත උපලේඛනයේ දැක්වෙන පාර හොරණ නගර සභාව සතු පාරක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව මෙම අතුරු මාර්ගය දෙපස පදිංචි දේපළ හිමියන්ට හා පොදු මහජනතාවට දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ග්‍රැන්විල් රාජපක්ෂ,
සභාපති,
හොරණ නගර සභාව.

2012 ජුනි මස 14 වැනි දින,
හොරණ නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| පාරේ නම | විස්තරය | ආරම්භක වරිපනම් අංක | අවසානය වරිපනම් අංක | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|---|
| පානදුර රත්නපුර කහටගහවත්ත පාර වරිපනම් අංක 153,151,151/2, 151/3,151/4,151/6 151/8,151/10, 151/25,151/25,151/13 දරන නිවාස වලට පිවිසෙන අතුරු මාර්ගය | හොරණ දිසා අධිකරණයේ අංක 6169/එල් නඩුවේ 2011.08.01 ලබා දුන් තීන්දුව හා තීන්දු ප්‍රකාශය අනුව බලයලත් මිනින්දෝරු ජී. අදිකාරම් මහතා විසින් මැන සකස් කරන ලද මෙම නඩු වාර්තාවට ගොනු කර ඇති 2009.12.12 අංක 3507 දරන පිඹුරේ කොල පාටින් සලකුණු කර ඇති අතුරු මාර්ගය | 153,151 | 151/13 සහ වාහන හැරවීමේ වෘත්තය | 426 | 12 |

07-598

**තවලම ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 20 (1) වගන්තිය යටතේ කරන දැන්වීමයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 20 (1) වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති ක්‍රීඩාපිටිය සඳහා වූ ඉඩම තවලම ප්‍රාදේශීය සභාව සතු පොදු ක්‍රීඩා පිටියක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම ඉඩමේ අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් විරුද්ධතාවයක් පල කරන්නේ නම් මෙම නිවේදනයේ දින සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 20(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2012 ජුනි මස 29 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

*ඉඩමේ විස්තරය* :

ගාල්ල දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනන්ගල බටහිර ගමෙහි පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩබ්. පතිරණ මහතා විසින් පිළියෙල කරන ලද අංක 4540 දරන සැලැස්මේ කැබලි අක්ෂරය ''ඒ'' ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් අක්කර 2 රූඩ් 2 පර්චස් 11.58ක් පමණ විශාලවන බඩාමුව වත්ත නමැති ඉඩමට මායිම්,

*උතුරට* : පාර, බඩාමුව කුඹුර, කනත්ත,
*නැගෙනහිරට* : කනත්ත, හෙට්ටිකන්ද ඇල
*දකුණට* : හෙට්ටිකන්ද ඇල
*බටහිරට* : හෙට්ටිකන්ද ඇල, බඩාමුව කුඹුර

07-527